සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ ලෝකය මැවූ දින ගණන වන්නේ,
    i. දින දහයකින්. ii. දින සතරකින්. iii. දින හයකින්. iv. දින හතකින් ය.

02. ග්‍රාබ්‍රියෙල් දේවදූතයා මරියතුමියට දැනුම් දුන්නේ කාගේ උපත පිළිබඳව ද ?
    i. එලිසබෙත් තුමිගේය ii.ස්නාවක ජෙහාන්ගේය iii. ජේසුස් වහන්සේගේය iv. පේදුරු තුමාගේය

03. ජේසුස් වහන්සේ උපත ලැබූ ස්ථානය වන්නේ.
    i. රජ මාළිගාව තුළ ii. ගලීල මුහුද අසල iii. පාළු කතරේ ය iv. ගව මඩුවේදී

04. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් ගණන වන්නේ
    i. සතරකි ii. තුනකි iii. දෙකකි iv. එකකි

05. අපගේ ජීවිතය ලබා දුන්නේ කවුරුන්ද?
    i. දෙවියන් වහන්සේ ය. ii. ජේසුස් වහන්සේ ය.
    iii. ශුද්ධෝත්මයානන් වහන්සේ ය. iv. ආබ්‍රහම් තුමා ය.

- 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 06. මැවිල්ල ගැන සඳහන් වන පොත | සුවය ලැබේ |
| 07. ජේසුස් වහන්සේගේ උපත දැනුම් දුන්නේ | සනාවක ජෙහාන් තුමා |
| 08. අප විසින් පරිසරය | උප්පත්ති |
| 09. ජනතාවගේ හදවත් පවිත්‍ර කළේ | ආරක්ෂා කළ යුතුයි |
| 10. ඇදහිල්ලෙන් | ගාබ්‍රියෙල් දේවදූතයා |

- අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

11. දරුවන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම අපගේ වගකීමකි ( )
12. දෙමාපියන්ට කීකරු වීම උතුම් ගුණාංගයක් නොවේ ( )

13. ප්‍රේමය යහපත් සාමාරිකයාගේ කතාවෙන් පෙන්නුම් කරයි ( )

14. ඇදහිල්ලෙන් සිටිය යුතු නොවේ ( )

15. දෙවියන් වහන්සේගේ මැවිල්ල මනහරය ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා ලියන්න.**

16. අප දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරීම ............................................ ය.

17. ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ .......................................... බව ප්‍රකාශ කළේය.

18. නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ ...................................... නොකරන්න.

19. දෙවියන් වහන්සේ ........................................ නිර්මාණය කොට මිනිසා පදිංචි කළේය.

20. මා පියාණන්ගේ ....................................... සිටිය යුතු බව ඔබ නොදන්නෙහිද ?

( ඒදන් උයන, පාපය, පුත්‍රයා, පරික්ෂා, ගෘහයේ )

---

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. 1. දේව මැවිල්ලේ විශිෂ්ටතම මැවිල්ල කුමක්ද ?

2. දෙවියන් වහන්සේ සිව් වන දිනයේ මවන ලද දේවල් දෙකක් ලියන්න.

3. ඔබේ නිවස වට පිටාවේ තිබෙන ඖෂධ වර්ග දෙකක් ලියන්න.

4. ජුදා සමාජයේ කොන් කරන ලද ජන කොටස් දෙකක් ලියන්න.

5. ඔබ තුළ තිබෙන දේව ගුණාංග දෙකක් ලියන්න.

6. කිතුනු අපගේ දිනපතා ජීවිතයට එකතු කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

7. ජේසුස් වහන්සේගේ කුරුසයේ දී පැවසූ වදන ලියන්න .

8. ඉගෙනීමට දුර්වල මිතුරෙකුට කළ හැකි උපකාර දෙකක් ලියන්න.

(ලකුණු 2 x 8 = 16)

02. 1. දෙවි පියා මවන ලද දේවල් දෙකක් ලියන්න.

2. දේව ඇදහිල්ලෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න.

3. දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි ක්‍රියා මාර්ග හයක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

03. 1. ආරම්භයේදී දෙවියන් වහන්සේ මැව්වේ මොනවාද?

2. චන්ද්‍රයාගෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න.

3. දේව මැවිල්ලට තුති පුදමින් යාඥාවක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

04. 1. ජේසුස් වහන්සේ ජෙරුසලම දේව මාලිගාවට ගියේ කා සමගද?

2. වයස අවුරුදු 12 යුදෙව් පිරිමි දරුවකු ලබන වරප්‍රසාද දෙකක් ලියන්න.

3. ඒ ගමනේදි වූ විශේෂ සිද්ධියෙන් අපට ගත හැකි ආදර්ශ තුනක් දක්වන්න.

(ලකුණු 2+3+6 = 11)

05. 1. ජේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගැසනු ලැබුවේ කුමන දවසකදීද.

2. ජේසුස් වහන්සේට ලබා දුන් දඬුවම් මොනවාද?

3. අපගේ ගැලවීම උදෙසා දිවි පිදූ ජේසුස් වහන්සේ වෙනුවෙන් අපට කළ හැකි දේවල් හයක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

06. 1. කාන්තාවන් ජේසුස් වහන්සේගේ සොහොන වෙත ගියේ ඇයි ?

2. එම අවස්ථාවට ගිය කාන්තාවන් දෙදෙනා කවුද?

3. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය තුළින් අපට ලැබී ඇති වරප්‍රසාද හයක් දක්වන්න.

(ලකුණු 2+3+6 = 11)